# රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් හා ආචාර ධර්ම

එච්.ඩී.ඊ ගුණසේකර

මාධ්‍ය නිලධාරි - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

---

ශ්‍රව්‍ය දෘශ්‍ය සංකලනය රූපවාහිනිය ජනප්‍රිය මාධ්‍යක් බවට පත්වීමට හේතු වී තිබේ.එය වර්තමානය වනවිට පුද්ගල මනසට ඉතා තියුණු ලෙස බලපෑම් කිරීමට සමත්ව තිබෙන අතර,ළමා මනසට දැඩි ලෙස බලපෑමක් එල්ල කරයි.ලොව පුරා දේශපාලන ,සමාජ,ආර්ථික හා සංස්කෘතික ප්‍රවණතා නිර්මාණය කිරිමෙහිලා මෙම මාධ්‍ය දීර්ඝ කාලීනව බලපෑම් කර තිබේ.එම තත්වය ශ්‍රී ලංකාව ආශ්‍රිතව ඉතා තියුණු ලෙස දක්නට ඇත.

විවිධාකාර අන්තර්ගතයන්ගෙන් හා විචිත්‍රවත් ආකෘතිවලින් සමන්විතවන රූපවාහිනි මාධ්‍ය පෞද්ගලික ගෘහස්ථ සමීපතාවයකින් යුක්තය.ආකර්ෂණීය මාධ්‍යක් වන එය සංකීර්ණ තාක්ෂණික ක්‍රියාවලියකින් යුක්ත වේ.පුද්ගලයාගේ පූර්ණ අවධානය ග්‍රහණය කර ගැනීමට ද රූපවාහිනිය සමත්ව තිබීම විවාද සම්පන්නය.

එමෙන්ම රූපවාහිනී මාධ්‍ය, විවිධ වැඩසටහන් ආකෘතිවලින් සමන්විතය.එය සංකීර්ණ විෂය පථයකින් යුක්තය. රූපවාහිනිය ජනමතය බිහි කිරිමේ ප්‍රධානියා වන අතර, එය තවදුරටත් පරමාදර්ශිකයෙකු ලෙස ප්‍රේක්ෂක රසික ජනතාවට සිය අවශ්‍යතාවයන් තීරණය කරයි.රූපවාහිනී මාධ්‍ය සතුව යම් අධිකාරි බලයක් ද පවතින අතර ,මජනතාවට තොරතුරු සැපයීමේ කාර්‍යයේදී ගාමක බලවේගයක් ලෙස කටයුතු කරයි.මෙලෙස අර්ථ ගැන්වෙන රූපවාහිනි මාධ්‍යට අනන්‍ය වැඩසටහන් වර්ග රැසකි.එන් කිහිපයක් පහත පරිදි වේ.

- වාර්තා හෝ වාර්තා ස්වරූපයේ වැඩසටහන්
- ප්‍රවෘත්ති වැඩසටහන්
- කාලීන වැඩසටහන්
- දේශපාලන වැඩසටහන්
- ආගමික වැඩසටහන්
- කාන්තා වැඩසටහන්
- ළමා වැඩසටහන්
- ක්‍රීඩා වැඩසටහන්
- සෞන්දර්‍යාත්මක වැඩසටහන්
- තාරුණ්‍යයේ වැඩසටහන්
- පරිසර වැඩසටහන්

මෙම රූපවාහිනි වැඩසටහන් අතර වාර්තා වැඩසටහන් සඳහා ප්‍රමුඛස්ථානයක් හිමිවෙයි.වාර්තා වැඩසටහනක ප්‍රවෘත්මය ලක්ෂණ පැවතියද ,එහිදී ඊට වඩා ප්‍රබලව කිසියම් ප්‍රස්තුතයක් වන කාරණාවක් වාර්තාමය ස්වරූපයකින් ගෙනහැර දැක්වීම සිදු කරයි.වර්තමාන ලෝකයේ තත්‍ය තොරතුරු හෙළි කිරීමට වාර්තා වැඩසටහන් නිෂ්පාදකයන්ට,උවමනාව හා උනන්දුව පවතී.ඇමරිකා එක්සත් ජනපදයේ CBS Reports වැඩසටහනේ සම්පාදකවන ෆ්‍රෙඩ් ෆ්‍රෙන්ඩ්ලි සඳහන් කරන්නේ වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීම අභියෝගාත්මක කාර්යයක් බවයි.

‘‘Every day there is more for the people of the world to know, and every day, what we do not know kill us. We of CBS Reports believe that our job is to try to cast a little, create a little more understanding of what people bother, what helps people , what can kill and what can save………….’’

ලෝක ප්‍රජාවට බොහෝ දේ දැන ගැනීමට තිබෙන බවත් ,මානවයා හිරිහැරයට ලක් වන, ඔවුන්ට උදවු කළ හැකි,දැඩි පීඩාවට ලක් කල හැකි ,ආරක්ෂා කල හැකි දේ ගැන දැනුවත් කිරීම වාර්තා වැඩසටහන් වල ප්‍රමුඛ කාර්යන් වන බව ෆ්‍රෙඩ් ෆ්‍රෙන්ඩ්ලි සඳහන් කරයි.

රූපවාහිනී වාර්තා වැඩසටහන් අතර විවිධ ප්‍රවර්ගද දක්නට ලැබෙන අතර ,එහිදී රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් වලට ප්‍රමුඛත්වයක් හිමිවේ.විශේෂයෙන් පොදුවේ ගත් කළ ළමයාගේ පරිවර්තන කාලය සම්බන්ධයෙන් මූලික පරමාදර්ශය සපයනුයේ මෙම රූපවාහිනී මාධ්‍යයයි.ළමයා තුළ සිදුවන වෙනස්වීම,විනෝදාස්වාදය හා ළමා මනසේ විවේකය වැනි කාරණා සඳහා මෙම රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් ප්‍රබල දායකත්වයක් සපයයි.

මෙම වාර්තා වැඩසටහන් නිෂ්පාදනයේදී ඉතා ප්‍රවේශම්කාරි විය යුත්තේ එමගින් ළමා මනසට ලබා දෙන මානව හැඟීම් දිර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ට බලපෑම් කළ හැකි බැවිනි. රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් මගින් ළමයාට ලබා දෙන අධ්‍යාපනය ඔවුන්ට මනා රුකුලක් වේ.ඇතැම් ජාත්‍යන්තර නාලිකා රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කරන්නේ ළමයින්ගේ ද සහභාගීත්වය ඇතිවය.එය එම වැඩසටහන් සාර්ථක වීමට හේතුවේ. රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් විවිධ තේමා මත පදනම්ව නිෂ්පාදනය කෙරෙන අතර ,ඒවා ප්‍රධාන වශයෙන් පහත පරිදි හඳුනා ගත හැකිය.

- සෞන්දර්‍යය
- අධ්‍යාපනය
- ළමා ආරක්ෂාව
- පරිසරය
- ක්‍රීඩා

- ආගමික
- කාලීන තොරතුරු
- මානව වයිා

මෙකී තේමා පදනම් කරගෙන රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීමේදී මාධ්‍ය ආචාර ධර්ම කෙරෙහිද විශේෂත්වයක් දැක්විය යුතුය.විශේෂයෙන් පොදුවේ රූපවාහිනී නාලිකා සඳහා බලපානු ලබන ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය වර්තමානය වන විට තදින් පවති.1982 වර්ෂයේදී ශ්‍රී ලංකා රූපාවාහිනි සංථා පනතේ වගන්ති අනුව වැඩසටහන්කරණයට අදාළ කොටස් කිහිපයක් මගපෙන්විම් ලෙස භාවිත කළ හැකි වුවද ,එය ප්‍රමාණවත් නොවේ.

ප්‍රධාන වශයෙන් රූපවාහිනී මාධ්‍යට විශේෂිතව පැවතිය යුතු ආචාර ධර්ම ප්‍රවර්ග කිහිපයක් ජාත්‍යන්තර හා දේශිය තත්වයන් අධ්‍යයනය කිරීමේදී දක්නට ලැබේ.ඒවා පහත පරිදි වේ.

- රූපවාහිනී විකාශන ආචාර ධර්ම
- රූපවාහිනී පරිපාලනමය ආචාර ධර්ම
- රූපවාහිනී ප්‍රතිපත්තිමය ආචාර ධර්ම
- නිවේදක නිවේදිකාවන් සතුවිය යුතු ආචාර ධර්ම
- වැඩසටහනින් වැඩසටහනට බලපැවැත්වෙන ආචාර ධර්ම
- තාක්ෂණික වශයෙන් පවතින ආචාර ධර්ම
- ප්‍රේක්ෂකයන්ට බල පැවැත්වෙන ආචාර ධර්ම

රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් නිෂ්පාදනයේදී අදාළ පාර්ශවයන් ස්වයං පාලනයක් ඇතිකර ගැනීම කාලෝචිතය.මූලික වශයෙන් මෙවැනි වැඩසටහන් සඳහා ළමයින් දායක කර ගැනීමේදී භාරකරුවන්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.විශේෂයෙන් ළමයාගේ අභිමානයට හානියක් නොවන ලෙස රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් නිර්මාණය කළ යුතුය.මීට අමතරව රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන්කරණයේදී පහත ආචාර ධර්මයන් හා මාර්ගෝපදේශයන් අනුගමනය කිරීම කාලින අවශ්‍යතාවයකි.

- රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන්කරණයේදී අසත්‍ය කරුණු පළ නොකිරීම
- අනුමාන හා උපකල්පන මත පදනම් නොවීම
- ළමා මනසට ගැලපෙන ලෙස රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කිරීම
- පොදුජන රුචියට හා සදාචාරයට හානි නොකිරීම
- ළමා ලිංගික අපරාධ වැනි සංවේදී කාරණා පිළිබඳ රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් නිෂ්පාදනයේදී මනා විනයක් පවත්වා ගෙන යාම හා ළමා වින්දිතයින්ගේ අනන්‍යතාවය කිසිදු අයුරකින් හෙළි නොකිරීම

- නූතන ලෝකයේ පවතින මායාව හා යථාර්තය නිවැරදිව හදුනාගත හැකි වන පරිදි රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන් සදහා ප්‍රස්තුතයන් ගොඩ නැගීම

සමකාලින ගෝලීය ප්‍රවාහය තුළ රූපවාහිනි ළමා වාර්තා වැඩසටහන්කරණයේදි යම් ආචාර ධර්ම පද්ධතියක් පැවතියද එය කොතෙක් දුරට ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේද යන්න විවාද සම්පන්නය.ලෝක සන්නිවේදන තත්වයන් තුළ යම් ඵලදායි ප්‍රවේශයක් මේ සම්බන්ධව දක්නට ලැබුණද එය දේශිය වශයෙන් ප්‍රායෝගික තලයේ දක්නට නොමැති වීම ගැටලු සහගතය.රාජ්‍ය රූපවාහිනී නාලිකා මෙවැනි ආචාර ධර්මීය ප්‍රවේශයන් හා මාර්ගෝපදේශ යම්තාක් දුරට අනුගමනය කලද ,ජන මූල යැයි සැලකෙන පුද්ගලික රූපවාහිනී නාලිකා තුළ එවැනි තත්වයක් දක්නට නොමැත.ප්‍රධාන වශයෙන් රූපවාහීනි මාධ්‍ය සදහා පොදුවේ පිළිගත් ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය ශ්‍රී ලාංකේය සමාජය තුළ ප්‍රබලව පවතින අතර ,එය ඉටුකර ගැනීම සදහා සියලු පාර්ශවයන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම කාලීන වන්නේය.

මූලාශ්‍ර

ගුණසේකර,එච්.ඩී.ඊ,(2019).ළමා අපයෝජන හා ළමා සැකකරුවන් පිළිබද ජනමාධ්‍ය භාවිත ප්‍රවේශය, ගොඩගේ ප්‍රකාශකයෝ,කොළඹ 10

විජේසිංහ,ප්‍රසන්න.(2008).රූපවාහිනි වැඩසටහන්කරණය,සුසර ප්‍රකාශකයෝ,පිළියන්දල

ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථා පනත,1982

හපුආරච්චි,අජන්තා ,(2018) .ප්‍රවෘත්ති හා ප්‍රවෘත්ති වාර්තාකරණය,ගොඩගේ ප්‍රකාශකයෝ,කොළඹ 10

හෙට්ටිආරච්චි,ස්ටැන්ලි.(2016).සංස්කරණයේ ශික්ෂා පද,කර්තෘ ප්‍රකාශන